**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 02 ව්‍යාපෘතිය (අඹතලේ ජල සම්පාදන පද්ධතිය වැඩිදියුණු කිරීම සහ බලශක්ති ඉතිරි කිරීමේ ව්‍යාපෘතිය) - 2023**

---

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 02 ව්‍යාපෘතියේ (**අඹතලේ ජල සම්පාදන පද්ධතිය වැඩිදියුණු කිරීම සහ බලශක්ති ඉතිරි කිරීමේ ව්‍යාපෘතිය**) 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සහ ඒජන්සි ෆැන්වයිස් ද ඩිවලොප්මන්ට් අතර 2014 සැප්තැම්බර් 29 දින එළඹි අංක සී.එල්.කේ.1008-01පී දරණ ණය ගිවිසුමේ 3.4.2(එච්)වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සම්පාදන හා වතුයටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොළඹ හා තදාසන්න ප්‍රදේශ වල අබලන්වූ නලජාලය සහ උපකරණ වැඩිදියුණු කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම මඟින් ජල සැපයුම් පද්ධතියේ කාර්යක්ෂමතාව සහ විශ්වසනීයත්වය ඉහල නැංවීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 13,000 කට සමාන එජඩො මිලියන 100 ක් වන අතර ඉන් රු.මිලියන 9,100 කට සමාන එජඩො මිලියන 70 ක් මූල්‍යනය කිරීමට ඒජන්සි ෆැන්වයිස් ද ඩිවලොප්මන්ට් එකඟවී තිබුණි. ඉතිරි එජඩො මිලියන 30 සමාන රු.මිලියන 3,900 ක වටිනාකම ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 සැප්තැම්බර් 29 දින ආරම්භ කර තිබුණු අතර, 2019 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘති කාල සීමාව 2024 ජුනි 30 දින දක්වා තුන් වතාවක් දීර්ඝ කර තිබුණි.

### 1.3 මතය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංක | ගිණුම්කරණ අඩුපාඩු / විගණන නිරීක්ෂණය | වටිනාකම රු.මිලියන | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති කාර්යාලයේ භාවිතය සඳහා මිලදී ගත් රුපියල් මිලියන 3.36 ක් වටිනා පරිගණක, කාර්යාලීය ගෘහභාණ්ඩ සහ කාර්යාල උපකරණ දේපල පිරියත හා උපකරණ ලෙස දැක්වීම වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර තිබුණි. | 3.36 | රු.මි. 3.36 ක ඇස්තමේන්තු ගත වටිනාකම 2024 මූල්‍ය ප්‍රකාශනයන්හි දේපල පිරියත හා උපකරණ යටතේ වාර්තා කෙරේ. | වත්කම් නිවැරදි කාණ්ඩය යටතේ ගිණුම්ගත කළ යුතුය. |

**3.** **භෞතික කාර්ය සාධනය**

**3.1** **භෞතික ප්‍රගතිය**

ව්‍යාපෘතිය 2014 සැප්තැම්බර් 29 වන දින එහි කටයුතු ආරම්භ කර තිබූ අතර 2019 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය සැලසුම් කල කාලය තුළ ඉලක්ක සපුරා ගැනීමට අසමත් වීම හේතුවෙන් ව්‍යාපෘතියේ කාලසීමාව 2024 ජුනි 30 දක්වා තෙවතාවක් දීර්ඝ කර තිබුණි. ප්‍රගති වාර්තාවට අනුව, ව්‍යාපෘතිය ආරම්භකර වසර 09 කුත් මාස 3 ක් ගත වූ පසුවත් 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙළින් සියයට 81 ක් සහ සියයට 70.75 ක් ව තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී ද ව්‍යාපෘතිය භෞතික වශයෙන් සියයට 10.87 ක ප්‍රගතියක් පමණක් ලබාගෙන තිබූ බව නිරීක්ෂණය වූ අතර ව්‍යාපෘතියේ සංරචක අනුව ප්‍රගතිය පහත පරිදි විය.

| අංකය | ව්‍යාපෘති ක්‍රියාකාරකම | 2023 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත ඉලක්කය (%) | සත්‍ය ප්‍රගතිය (%) | | | |
| (අ) | ගොතටුව සන මීටර් 15,000 ක ජලාශය, මොරගස්මුල්ලේ බූස්ටර් පොම්පාගාරය ඉදි කිරීම සහ කි.මී. 5 ක් සඳහා මි.මී. 1,200 ඩී.අයි නල එලීම | 100 | 86.04 | කොන්ත්‍රාත් කාලය තවදුරටත් දීර්ඝ කිරීමට සිදුවීම සහ සැලසුම් කල පරිදි ව්‍යාපෘතිය නිමකිරීමේ අවදානම් තත්වයක් පැවතීම. | මූලික කොන්ත්‍රාත්තුව අන්‍යෝන්‍ය එකඟතාවය මත අවසන් කිරීම හේතුවෙන් කොන්ත්‍රාත්තුව ප්‍රමාද වූ අතර කොන්ත්‍රාත්තුව, 2 වැනි අඩුම මිල ගණන් යටතේ වූ කොන්ත්‍රාත්කරුට නැවත ප්‍රදානය කරන ලදී. | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනය නොකිරීමට සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබා නොගැනීමට කළමනාකාරීත්වය වගකිව යුතුය. |
| (ආ) | අඹතලේ නිෂ්පාදන පහසුකම්වල විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සහ බලශක්ති ඉතිරිකිරීම සඳහා සුදුසු ධාරිතාවකින් යුත් කාර්යක්ෂම පොම්ප ස්ථාපනය කිරීම, අඩු සර්ෂණය හරහා සම්ප්‍රේෂණ පාඩු අවම කිරීම සහ අනෙකුත් නිෂ්පාදන පහසුකම් වැඩිදියුණු කිරීම තුළින් බලශක්තිය ඉතිරිකිරීම. | 82.90 | 65.03 | නියමිත දිනට පෙර ව්‍යාපෘතිය නිම කිරීමේ අවදානම් තත්වයක් තිබිය හැකිය. | ප්‍රසම්පාදන ප්‍රමාද වීම, සැලසුම් වෙනස් කිරීම, කොවිඩ් 19 බලපෑම, මූල්‍ය අර්බුදය හා අමුද්‍රව්‍ය හිඟවීම කොන්ත්‍රාත්තුව ප්‍රමාද වීමට හේතු විය. | අපේක්ෂිත අරමුණු කරා ළඟාවීම සඳහා ඉතිරි වැඩ කඩිනම් සැලැස්මක් සමඟ සම්පූර්ණ කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ සැලසුම් සමාලෝචනය සහ ඉදිකිරීම් අධීක්ෂණ උපදේශන සේවාව සඳහා වන කොන්ත්‍රාත්තුව රු.මිලියන 461 කට 2015 දෙසැම්බර් 01 දින මාස 36ක් ඇතුළත අවසන් කිරීමට පෞද්ගලික උපදේශන සේවා සමාගමකට ප්‍රදානය කරන ලදී. කෙසේ වෙතත්, අයි.සී.බී. 05 සහ අයි.සී.බී. 03 හි උපදේශන කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කර නොතිබූ අතර ව්‍යාපෘති කාල සීමාව පුරාවට කොන්ත්‍රාත්කරුවන්ගේ දිගු ප්‍රමාදයන්, අකාර්යක්ෂමතාව සහ දුර්වල කාර්යසාධනය පෙන්නුම් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, උපදේශන කාලය 2024 ජූනි 30 දක්වා 6 වතාවක් දීර්ඝ කිරීමට සිදු වී තිබුණු අතර, තවදුරටත් 6 වැනි දිගුවේදී උපදේශන කොන්ත්‍රාත්තුවේ යෙදවුම් සඳහා රුපියල් මිලියන 21 ක් වැය කර තිබුණි. එබැවින් ව්‍යාපෘතියේ සමස්ත උපදේශන සේවා පිරිවැය ඇස්තමේන්තුගත උපදේශන පිරිවැයට වඩා රුපියල් මිලියන 159 කින් වැඩි වී තිබුණු අතර උපදේශන කොන්ත්‍රාත්තුව විධිමත් අනුමැතියකින් තොරව 2024 ජූලි 10 විගණන දිනය වන විටත් ක්‍රියාත්මක වෙමින් පවතී. | 4.1.1, 4.1.2 වගන්තිවල දක්වා ඇති කරුණු කොන්ත්‍රාත් ප්‍රමාදයන් ඇති වීමට හේතු වී තිබුණි. විදේශ විශේෂඥයින්ට අවශ්‍ය ගෙවීම් වලක්වා ගැනීම සඳහා උපදේශකයාගේ විශේෂඥයින් යොදවා ගන්නා ලදී. කෙසේ නමුත් විදේශ විශේෂඥයින් යොදවා නොගැනීම හේතුවෙන් ඉතිරිවූ පිරිවැය යොදාගනිමින් කොන්ත්‍රාත්තු පැකේජයන්වල ප්‍රගතියත් සමඟ උපදේශන කොන්ත්‍රාත්තුව දීර්ඝ කරන ලදී. අයි.සී.බී. 03 සහ අයි.සී.බී. 05 තවමත් ක්‍රියාත්මක වන බැවින්, උපදේශන සේවාවේ කාලය දීර්ඝ කිරීමට අවශ්‍ය වේ. 2024 ජූලි 25 වැනි දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු බැවින් විධිමත් අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද විය. | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් නියමිත කාල සීමාව තුළ අවසන් කිරීමට සහ තවදුරටත් පාඩු අවම කර ගැනීමට උපදේශකවරයා සමීපව අධීක්ෂණය කළ යුතුය. |
| (ආ) | අයි.සී.බී. 04 කොන්ත්‍රාත්තුව 2016 ජූලි 01 දින සිට දින 672 ක් සඳහා ප්‍රදානය කරන ලද අතර පසුව එය 2024 ජූනි 30 දක්වා දීර්ඝ කර තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්කරු 2024 ජූනි 30 වන විට (අත්හිටුවීමේ කාලය හැර) දින 903 වෙනුවට දින 2,428 ක් ලබාගෙන තිබුණි. ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාවට අනුව, 2023 දෙසැම්බර් 31 වන විට සමස්ත භෞතික ප්‍රගතියෙන් සියයට 99 ක් පමණක් ළඟාකරගෙන තිබුණි. එසේ වුවද, එළි හවුස් පොම්පාගාරය තවමත් පොම්ප ස්ථාපනය කිරීමේ අදියරේ පවතින බැවින් විෂබීජහරණ කටයුතු සඳහා ප්‍රමාණවත් ජලය ලබාගැනීමේ ගැටළුවක් පැවතීම නිසා 2024 ජූලි 10 වන විටත් නළ සේදීම් හා විෂබීජහරණ කටයුතු සිදුකර නොතිබුණි. | එළි හවුස් පොම්පාගාරයේ දැනට කෙරෙමින් පවතින ඉදිකිරීම් කටයුතු හා විෂබීජහරණය සඳහා අවශ්‍ය ජල ප්‍රමාණය ලබා ගැනීමේ දුෂ්කරතා හේතුවෙන් විෂබීජහරණ හා පිරිසිදු කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාද වී ඇත. මෙම ගැටළුව විසඳීම සඳහා, අලුතින් එලන ලද නල මාර්ගය පැරණි නල පද්ධතියට සම්බන්ධ කර ඇති අතර, එළි හවුස් පොම්පාගාරයේ පොම්ප ස්ථාපනය කිරීම අගෝස්තු මැද භාගය වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ස්ථාපනය අවසන් වූ පසු, තවදුරටත් ප්‍රමාදයකින් තොරව විෂබීජහරණ ක්‍රියාවලිය ප්‍රමාදයකින් තොරව කළ හැකිය. | නල ස්ථාපනය හා ක්‍රියාත්මක කිරීම තවදුරටත් ප්‍රමාදයකින් තොරව සම්පූර්ණ කිරීම සඳහා පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගොතටුව ඝන මීටර් 15,000 ජලාශය සහ බූස්ටර් පොම්පාගාරය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සමඟ කිලෝමීටර 05 ක් සඳහා ඩීඅයි නල (අයිසීබී 03) සැපයීම සහ එළීම සඳහා වන කොන්ත්‍රාත්තුව 2023 ජුනි 06 වන දින අවසන් කිරීමට නියමිතව තිබුණි. පසුව එය 2024 මැයි 07 දක්වා සිව් වතාවක් දීර්ඝ කර තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට සමස්ත භෞතික ප්‍රගතිය හා මූල්‍ය ප්‍රගතිය සියයට 86 ක් හා සියයට 83 ක් වූ අතර එය 2024 ජූනි 30 දිනට පිළිවෙලින් සියයට 93 ක් හා සියයට 85 ක් විය. තවද අයි.සී.බී. 03 කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය ව්‍යාපෘතියේ දීර්ඝ ප්‍රමාදයට ඍජුවම බලපා ඇති බව ව්‍යාපෘතියේ උපදේශකවරයා සිය ප්‍රගති වාර්තාවල සඳහන් කර තිබුණි. | ප්‍රමාදයන් සඳහා දායක වන මූලික සාධක අයිතම 4.1.1 හි දක්වා ඇති අතර දුර්වල පාංශු තත්ත්වයන්, භූගත උපයෝගිතා විශාල ප්‍රමාණයක් පැවතීම සහ සැලසුම් වෙනස්වීම් හේතුවෙන් ඇති වන අතිරේක කාර්යයන් නවතම කාලය දීර්ඝ කිරීමේ ඉල්ලීමට බලපාන සැලකිය යුතු ගැටළු වී ඇත. | සැලසුම් කර ඇති පරිදි අයි.සී.බී. 03 කොන්ත්‍රාත් පැකේජය තවදුරටත් ප්‍රමාදයකින් තොරව සහ රටට පාඩු නොලබන ආකාරයට සැලසුම් කර සම්පූර්ණ කිරීමට පිළියම් යෙදිය යුතුය. |
| (ඈ) | යෝග්‍ය ධාරිතාවයෙන් යුත් කාර්යක්ෂම පොම්ප සවිකිරීමෙන් බලශක්ති ඉතිරිකිරීම සඳහා අඹතලේ නිෂ්පාදන පහසුකම්වල විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සහ බලශක්ති ඉතිරිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව (අයි.සී.බී. 05) 2020 දෙසැම්බර් වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. ඉන් අනතුරුව කොන්ත්‍රාත් කාලය 2024 අප්‍රේල් 30 දක්වා සිව් වතාවක් දීර්ඝ කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව සමස්ත ව්‍යාපෘති ක්‍රියාකාරකම් වලින් සියයට 45.60ක බරක් නියෝජනය කළද, සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය 2023 දෙසැම්බර් 31 දිනට පිළිවෙළින් සියයට 65 ක් සහ සියයට 47 ක් ලෙස පෙන්නුම් කර තිබූ අතර 2024 ජූනි 30 වන විට එය පිළිවෙලින් සියයට 75 ක් සහ සියයට 48 ක් විය. | මෙම ප්‍රමාදයන් හේතුවෙන් කොන්ත්‍රාත්කරු අමතර කාල දිගුවක් ඉල්ලා ඇත. 2024 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. සංශෝධිත සැලැස්මට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීම සඳහා ව්‍යාපෘති කාර්ය මණ්ඩලය කොන්ත්‍රාත්කරුගේ ප්‍රගතිය සක්‍රීයව සුපරීක්ෂණය සහ අධීක්ෂණය කරමින් සිටී. | ව්‍යාපෘති කළමනාකාරීත්වය විසින් ව්‍යාපෘති අකාර්යක්ෂමතා සහ ව්‍යාපෘති අනවශ්‍ය ප්‍රමාදයන් නැවැත්වීමට පියවර ගත යුතුය. |

### 3.3 මතභේදාත්මක ස්වභාවයේ කරුණු

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | i ජාතික ජල සම්පාදන මණ්ඩලය විසින් පැරණි සහ අකාර්යක්ෂම බලශක්ති ඵලදායීතාවයක් ගෙනදෙන තෝරාගත් පොම්ප සංඛ්‍යාවක් ප්‍රතිස්ථාපනය කොට වැඩි බලශක්ති කාර්යක්ෂමතාවයක් ලබාගැනීමේ ඉලක්කයක් ළඟාකරගැනීමේ අරමුණ ඇතිව සහ | ව්‍යාපෘතියේ මූලික ප්‍රමාදයන් සඳහා, ඉඩම් සම්බන්ධ ගැටළු, අන්‍යෝන්‍ය එකඟතාව මත කොන්ත්‍රාත්තු අවසන් කිරීම් සහ මූල්‍ය ගැටලු හේතු විය. පසුව, 2019 අග සිට 2021 අවසානය දක්වා ඇති වූ වසංගත අර්බුදය, රටේ ආර්ථික පසුබෑම කොන්ත්‍රාත්කරුට | සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමට අපොහොසත් වීම පිළිබඳව ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනය සිදු නොකිරීමට හේතුව සොයා බැලීම සඳහා පරීක්ෂණයක් පැවැත්විය |

| | | | |
|---|---|---|---|
| | සර්ෂණ අලාභ අවම කරගැනීම සඳහා භූගත ජලාශ ඉදිකිරීමෙනුත්, දිරාපත් වූ නළ ජාලය විශාල විශ්කම්භයක් සහිත නළ යොදා ප්‍රතිස්ථාපනය කිරීමටත් තීරණය කර තිබුණු අතර ඉහත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා නව පොම්ප 17 ක් ප්‍රතිස්ථාපනය කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ඉහත පොම්ප 17 න් 13 ක් මිලදීගෙන ඉන් 12 ක් ස්ථාපනය කර තිබුණි. එසේම, ගොතටුව හයි ලිෆ්ට් පොම්පාගාරය සඳහා පොම්ප 4 ක් මිලදීගැනීමේ ප්‍රසම්පාදන කටයුතු විගණිත 2024 ජුලි 10 වන දින වන විටත් අවසන් කර නොතිබුණි. තවද ප්‍රවාහ මීටර් 16 න් එක් ප්‍රවාහ මීටරයක්, සර්ජ් වෙසල් 11 න් 3 ක් සහ ස්කාඩර් පද්ධතිය පමණක් එම දිනය වන විට සවිකර තිබුණි. | ඍජුවම බලපෑ අතර අනුමත වැඩසැලැස්මට අනුගත වීමට ඉන් නොහැකි විය.<br><br>අඹතලේ අඛණ්ඩ ජල සැපයුමට බාධා කිරීමේ අභියෝග හේතුවෙන් පොම්ප ස්ථාපනය ප්‍රමාදයන්ට මුහුණ දෙන ලදී. අඹතලේ ජල පවිත්‍රාගාරය නොනවත්වා ක්‍රියාත්මක කල යුතු මෙන්ම යල් පැන ගිය පිරිපහදු පරිශ්‍රයක් බැවින් ප්‍රායෝගික දුෂ්කරතා ද මතුවිය. මෙම ගැටළු කොන්ත්‍රාත්කරුට සහ සේවායෝජකයාට පාලනය කළ නොහැකි විය. | යුතුය. කළමනාකරණයට, හොඳින් පාලනය කළ හැකි තත්වයක් සඳහා නිදහසට කරුණු නොමැත. එබැවින් 2024 වසර අවසන් වීමට පෙර සම්පූර්ණ ව්‍යාපෘතිය නිම කිරීමට විශේෂ අවධානයක් යොමු කළ යුතුය. |
| ii | ව්‍යාපෘති ක්‍රියාකාරකම් 2016 සිට ආරම්භ කර ඇති අතර මූලික ව්‍යාපෘති නිමකිරීමේ දිනය 2019 දෙසැම්බර් 31 වන දින වුවද තෙවරක් කාල දීර්ඝ කිරීම් ලබා දී තිබුණත්, ව්‍යාපෘතිය යටතේ ඇති කිසිදු ප්‍රධාන කොන්ත්‍රාත්තුවක් 2024 ජුලි 31 දින වන විටත් සම්පූර්ණයෙන් නිම කර නොතිබුණි. කෙසේ වුවද ව්‍යාපෘති කළමණාකරණ ඒකකය විසින් පරිපාලනය, උපදේශනය, නඩත්තුව යනාදී වශයෙන් විශාල මුදල් ප්‍රමාණයක් දරමින් ව්‍යාපෘතිය ඇදගෙන යමින් පවතින අතර ආර්ථිකයට කිසිදු ප්‍රතිලාභයක් නොමැතිව ණය වාරික (මිලියන 234), බැඳීම් ගාස්තු (මිලියන 390), ණය පොලී (මිලියන 621) වැනි වියදම් ව්‍යාපෘතිය වෙනුවෙන් රජය දරා ඇත. අනෙක් අතට ඉහළ බලශක්ති පරිභෝජනය අඩුකිරීමේ අපේක්ෂිත අරමුණ සාක්ෂාත් කර ගැනීමකින් තොරව එන්.ඩබ්.එස්.ඩී.බී හි ජල සැපයුම් සඳහා වන පිරිවැය ද වැඩි වේ. තවද, කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල සැලසුම්කරණය, දුර්වල කාර්ය සාධනය සහ ව්‍යාපෘති කළමනාකරණයේ දුර්වල කොන්ත්‍රාත්තු අධීක්ෂණය ද ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අහිතකර ලෙස බලපා තිබුණි. | ව්‍යාපෘති ප්‍රමාදයට දායක වී ඇති 4.1.1 සහ 4.1.2 වගන්තිවල දක්වා ඇති අභියෝග හැර, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (පී.එම්.යූ.) හිතාමතාම ප්‍රමාදයක් සිදු කර නැත. මීට අමතරව, කොන්ත්‍රාත්කරුගේ දුර්වල සැලසුම්, කාර්ය සාධනය හෝ අධීක්ෂණය හේතුවෙන් ප්‍රමාදය ආරෝපණය කළ නොහැක.<br><br>එසේ වුවද, ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කැපී පෙනෙන ධනාත්මක ප්‍රතිඵලවලට හේතු වී ඇත. අඹතලේ ජල පවිත්‍රාගාරයේ මාසිකව රු.මි. 18.5 පමණ බලශක්ති ඉතිරියක් නිරීක්ෂණය වන අතර එය මුළු විදුලි පිරිවැයෙන් දළ වශයෙන් 11% ක් පමණ නියෝජනය වේ. මෙම ඉතුරුම් අඛණ්ඩව සිදුවනු ඇතැයි අපේක්ෂා කරන අතර ව්‍යාපෘතිය අවසන් වූ පසු තවදුරටත් වැඩි විය හැක. | අනපේක්ෂිත තත්ත්වයන් කළමනාකරණය කර රටට තවදුරටත් මූල්‍ය බර පැටවීම වැළැක්වීම සඳහා කාර්යයන් කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අයි.සී.බී. 05 හි ප්‍රධාන කොන්ත්‍රාත්කරු විසින් 2023 මැයි 24 දිනැති අංක ZHSZJH/2857/05/23 ලිපිය මගින් ඇමරිකානු ඩොලර් 5,691,179.76 ක මුදලක් මිල ඉහළයාමේ හිමිකම් පෑම් ලෙස ඉල්ලා තිබුණි. කෙසේ වෙතත් එවැනි මිලක් ගෙවීමට කළමනාකාරිත්වය වගකිව යුතු නොවන බව විගණනයේ දී නිරීක්ෂණය විය. මෙය සැලසුම් සහ ඉදිකිරීම් ස්වභාවයේ කොන්ත්‍රාත්තුවක් බැවින් ගිවිසුමට අනුව මිල ඉහලයාම් ගෙවීමට වෙනත් කිසිදු ප්‍රතිපාදනයක් නොමැත. | මිල වැඩි කිරීම සඳහා අයි.සී.බී. 05 කොන්ත්‍රාත්කරුගෙන් අපට හිමිකම් පෑමක් ලැබී ඇත. කොන්ත්‍රාත්කරු ඔවුන්ගේ වැඩ සඳහා අවශ්‍ය යෙදවුම්වල පිරිවැය සැලකිය යුතු ලෙස වැඩි වීම හේතුවෙන් ගැලපීමක් ඉල්ලා ඇත. කොන්ත්‍රාත්කරු තර්ක කරන්නේ මෙම මිල වැඩි කිරීම් අනපේක්ෂිත සහ ඔවුන්ගේ පාලනයෙන් ඔබ්බට වන අතර, එබැවින් ගිවිසුම අත්සන් කරන අවස්ථාවේ එය ගණන් නොගත් බවයි. හිමිකම් පෑම දැනට ඇගයීමට ලක් කෙරෙමින් පවතිනු ඇත. ගනු ලබන ඕනෑම තීරණයක් සාධාරණ සහ ගිවිසුමේ නියමයන්ට අනුකූල වන බව සහතික කිරීම සඳහා අපි අදාළ සියලු විස්තර සහ සලකා බැලීම් ප්‍රවේශමෙන් සමාලෝචනය කරමින් සිටිමු. ඇගයීම් ක්‍රියාවලිය අවසන් වූ පසු අපි වැඩිදුර යාවත්කාලීන කිරීම් ලබා දෙන්නෙමු. | කොන්ත්‍රාත්කරුගේ ගෙවීම කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසිවලට අනුකූලව සහ මේ සම්බන්ධයෙන් විෂය දැනුමක් ඇති සාමාජිකයින් ඇතුළත් කමිටුවක නිර්දේශයක් මත සිදු කළ යුතුය. |
| (ඇ) | වසරක් ඇතුළත කාර්ය මණ්ඩල නිල නිවාස ඒකක 06 ක් ඉදිකිරීම සඳහා විටිනාකම රුපියල් මිලියන 129 ක කොන්ත්‍රාත්තුවක් 2021 අගෝස්තු 10 වැනි දින පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකුට ලබා දී තිබුණි. එයට 2023 සැප්තැම්බර් දක්වා දීර්ඝ කිරීම් හතරක් ලබා දී ඇති අතර නිමකිරීමට තවත් ඉතිරි වැඩ කිහිපයක් තිබියදී මණ්ඩලය විසින් අන්‍යෝන්‍ය එකඟතාවය මත කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණු අතර මිල ඉහලයාමේ පිරිවැය රුපියල් මිලියන 44.12 ක් ඇතුළුව රුපියල් මිලියන 131.51 ක් ගෙවා තිබුණි. තවද 2024 ජුලි 10 වැනි දින විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී සම්පූර්ණ ටයිල් කාර්යයන් සහ බොහෝ නිම කිරීමේ කටයුතු තවමත් අවසන් කිරීමට ඉතිරිව ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය. | ආරම්භක කොන්ත්‍රාත්තුවේ මිල ඉහලයාම් ගණන් බලා නැත. කෙසේ වෙතත්, කොන්ත්‍රාත් සංශෝධන -1 අත්සන් කිරීමෙන් පසුව, මිල ඉහලයාම හඳුන්වා දෙන ලදී. එසේ තිබියදීත්, කොන්ත්‍රාත් ප්‍රමාණ බිල්පතෙහි (බීඕකිව්) වෙන්කල මුදලක් ඇතුළත් නොවීය. | මිල ඉහළ යාම සහ ගිවිසුම් සංශෝධනය සාධාරණ පදනමක් මත සිදු කර තිබේද යන්න සොයා බැලිය යුතුය. |
| (ඈ) | ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුමට අනුව, ණය දෙන නියෝජිතායතනය විසින් වෙන්කල මුළු ප්‍රතිපාදනයෙන් සියයට 70ක් නියෝජනය කරමින් ඇමෙරිකානු ඩොලර් මිලියන 70කට සමාන රු.මි. 9,100 ක මුදලින් සියයට 60 ක් නියෝජනය කරමින් ඇමෙරිකානු ඩොලර් මිලියන 42.53 කට සමාන රුපියල් මිලියන 9,942 ක මුදලක් පමණක් ව්‍යාපෘතිය ආරම්භ වී වසර 8 කුත් මාස 3 කට පසු 2023 දෙසැම්බර් 31 | 4.1.1 සහ 4.1.2 වගන්තිවල දක්වා ඇති හේතු නිසා සැලසුම් කළ පුරෝකථනය අනුව කොන්ත්‍රාත්කරුවන්ට මුදල් ලබා දීමට ව්‍යාපෘතියට නොහැකි විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ණය ගිවිසුමේ කොන්දේසිවලට අනුකූලව රජයට බැඳීම් ගාස්තු දැරීමට සිදුවිය. එසේ වුවද, කොන්ත්‍රාත්තුව යටතේ පවතින | අනපේක්ෂිත තත්වයන් කළමනාකරණය කර ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වැඩ කඩිනම් කිරීමට සහ අනවශ්‍ය පිරිවැය අවම කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වන විට භාවිතා කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, උපයෝජනය නොකල ණය මුදල වෙනුවෙන් බැදීම් ගාස්තු ලෙස ඇමරිකන් ඩොලර් මිලියන 2.2 කට සමාන රුපියල් මිලියන 390.4 ක මුදලක් 2023 දෙසැම්බර් 31 වන විට රජය විසින් ගෙවා තිබුණි. | ප්‍රතිපාදන තුළ මෙම අතිරේක කාර්යයේ බලපෑම අවම කිරීමට ව්‍යාපෘතිය සෑම උත්සාහයක්ම ගෙන ඇත. | |

**3.4 පාලන පද්ධතිය**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2010 ජූලි 26 දිනැති අංක 05 දරන චක්‍රලේඛය මගින් නියම කර ඇති පරිදි ව්‍යාපෘතියේ ගනුදෙනු ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණනයට යටත් වී නොතිබුණි. | එන්.ඩබ්.එස්.ඩී.බී හි අභ්‍යන්තර විගණන අංශය විසින් 2023 වර්ෂය සඳහා වන ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් 2024 ජූලි 31 දිනට විගණනයක් සිදු කර නොමැත. | කාර්ය සාධන විගණනය මෙන්ම මූල්‍ය විගණනයද පැවැත්වීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2024 ජුනි 30 දිනට ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය 22 දක්වා සීමා කරන ලෙස ජාතික මෙහෙයුම් මැදිරි කමිටුව උපදෙස් දී තිබුණද, ඉහත තීරණය පිළිපැදීමට කටයුතු කර නොතිබූ අතර නිලධාරීන් 29 දෙනෙකු ව්‍යාපෘතියේ නිරතව සිටියහ. . | ඵලදායි ව්‍යාපෘති අධීක්ෂණය සහතික කිරීම සඳහා වැඩි කාර්ය මණ්ඩලයක් රඳවා තබා ගැනීම අත්‍යවශ්‍ය වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අඩු කිරීම ක්‍රමානුකූලව ක්‍රියාත්මක වනු ඇත. 2024 ජූලි 31 වන විට, කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව 27 දක්වා අඩු කර ඇති නමුත්, කාර්ය මණ්ඩල සාමාජිකයින් 20 දෙනෙකුගේ සේවා ස්ථානය ව්‍යාපෘති කාර්යාලය (ජ්ඩබ්එස්එස්අයිර්එස්පී) වන අතර අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයින් 7, එන්ඩබ්එස්ඩීබී සේවා ස්ථාන වල සේවය කරයි. ව්‍යාපෘතිය අවම කාර්ය මණ්ඩල සංඛ්‍යාවකින් අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර, මෙම කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ වැටුප් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් ආවරණය කෙරේ. | කළමනාකරණය ජාතික මෙහෙයුම් මැදිරි කමිටුව විසින් ලබා දෙන උපදෙස් වලට අනුකූල විය යුතුය. |